**පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

-----------------------------------------------------------------------------------------

පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2015 ඔක්තෝබර් 02 දින එළඹි අංක සීඒල්කේ 101104 එල් දරන ණය පහසුකම් ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දිනැති සීඒල්කේ 101104 එල් දරන සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.3(ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්ති ජාලක අවශෝෂණ ධාරිතාව ඉහළ නැංවීම, සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ දායකත්වය සඳහා අවස්ථාව ලබාදීම මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩල වේවැල්වත්තලල, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල කිලෝවොට් 132/33 කොටුමා උපපොළවල් ඉදිකිරීම යන සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ. ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,660.10 කට සමාන යුරෝ මිලියන 41.10 ක් වන අතර ඉන් රු. මිලියන 4,865.90 කට සමාන යුරෝ මිලියන 30ක් මූල්‍යනය කිරිමට ප්‍රංශ නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 1,794.20 කට සමාන යුරෝ මිලියන 11.1ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරිමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 ජනවාරි 06 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 31 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය සහ රාගල යන ප්‍රදේශවල 132/33KV කොටුමා උපපොළවල් ඉදිකිරීම අවසන් කර 2022 අප්රේල් 30 වන දින ලංකා විදුලිබල මණ්ඩලයට භාර දී තිබුණි.

## 2.2 අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ කටයුතු සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය විසින් වෙන් කරන ලද යුරෝ මිලියන 30 න්, ව්‍යාපෘතියේ සහ අනෙකුත් ව්‍යාපෘතිවල කටයුතු සඳහා රු. මිලියන 4,365.13 කට සමාන යුරෝ මිලියන 22.89 ක් පමණක් භාවිත කර තිබුණි. තවද, 2020 පෙබරවාරි 25 වන දින ව්‍යාපෘතියට ලැබුණු රු. මිලියන 491.12 කට සමාන යුරෝ මිලියන 2.5 ක තුන්වන අත්තිකාරම ව්‍යාපෘතියේ සහ අනෙකුත් ව්‍යාපෘතිවල කටයුතු සඳහා භාවිත කිරීමට වර්ෂ 03 කට වැඩි කාලයක් ගත කර තිබුණි. ඊට අමතරව, එම අත්තිකාරම් මුදලින්, රු. 84,968,301 කට සමාන යුරෝ 232,267 ක් 2023 දෙසැම්බර් 31 වන දින වන විට විශේෂ (යුරෝ) ගිණුමේ පැවතුන අතර, අරමුදල් භාවිත කිරීමේ කාලය ඉකුත් වීම හේතුවෙන් එය භාවිත නොකර ප්‍රදාන නියෝජිතායතනය වෙත ආපසු ගෙවිය යුතුය. | අදහස් ලබාදී නොතිබුණි. | ණය මුදල් ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුය. |

## 2.3 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| වේවැල්වත්ත ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා ඉඩම් හෙක්ටයාර 1.4508 ක් අත්පත් කර ගැනීම සඳහා රු. 5,867,156 ක වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි මුදලින් සියයට 44 ක් නියෝජනය කරන රු. 2,586,950ක මුදලක් පොලී ගාස්තු ලෙස දැරීමට සිදුවී තිබුණි. | අදහස් ලබාදී නොතිබුණි. | අමතර පිරිවැය අවම කිරීමට පියවර ගත යුතුය. |